# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
# WESTERN PROVINCE PROVINCIAL COUNCIL

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත,

## <u>සභා රැස්වීම</u>

2013 අගෝස්තු මස 19 වන දින එළඹුණු සභා සම්මුතිය හා කල් තැබීම අනුව, බස්නාහිර පළාතේ පළාත් සභාව 2013 සැප්තැම්බර් මස 03 වන දින පෙ.ව. 9.30 ට බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී රැස්වෙන බව කාරුණිකව දැනුම් දෙමි.

න්‍යාය පත්‍රය මේ සමඟ ඇත.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.08.19 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2013 සැප්තැම්බර් මස 03 වන දින පෙ.ව 09.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් , ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන , ආහාර සැපයීම් හා බෙදාහැරීමේ කටයුතු සහ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යතුමාගෙන් 2013.08.06 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/V (1)13/12)

අ. අත්තනගල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිවරයා, ගම්පහ දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමයේ අධ්‍යක්ෂකවරයෙකු බව දන්නේද ?

ආ. ඒ හේතුවෙන් සමුපකාර මණ්ඩලය වාර්ෂික 16.25%ක පොලියක් ලබා දෙන බව දන්වා තිබියදී, සමිතිය සතු මුදල්, ගම්පහ දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකුවේ රුපියල් ලක්ෂ 375 ක් 15.25%පොලියක් මතද, කොළඹ ග්‍රාමීය බැංකු සංගමයේ රුපියල් ලක්ෂ 150 ක් 16%පොලිය මතද, තැන්පත් කිරීමෙන් සමිතියට වාර්ෂිකව රුපියල් 412.500/- පොලිය අහිමි වූ බව දන්නේද ?

ඇ. 2012 වසරේ සභාපතිගේ කැමැත්තට ගම්පහ දිස්ත්‍රික් බැංකු සංගමයේ තැන්පත් කරන ලද මුදල් අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය මත ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ තැන්පත් කිරීමෙන් රුපියල් 468,750/- ක අමතර පොලියක් ලැබුණ බව පිළිගන්නේද ?

ඈ. සමිතිය යටතේ පාලනය වන සමූපකාර ෆාමසියට ලබා ගන්නා ඖෂධ සඳහා ලැබෙන කොමිස් මුදල් සභාපති පෞද්ගලිකව තමාම ලබා ගන්නා බව දන්නේද ?

ඉ. සමිතියේ පාරිභෝගික අංශය මාසිකව රුපියල් ලක්ෂ 15 ක පාඩුවක් ලබන බව දන්නේද ?

ඊ. මෙම වංචා හා දූෂණයන්ට එරෙහිව සමිතියේ උපසභාපති ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු 2013/06/20 දින සිට තනතුරු වලින් ඉල්ලා අස්වී ඇතිබව දන්නේද ?

උ. සභාපතිවරයාගේ විෂමාචාරයන්ට එරෙහිව පියවරක් ගන්නේද ? නොඑසේනම් මන්ද ?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

"2013.08.19 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී එළඹුණු එකඟතාවයට අනුව අද දින ( 2013.09.03 දින) විසිරයැමෙන් අනතුරුව මෙම සභාව 2013.09.24 දින පෙ.ව 9.30 ට රැස්විය යුතු අතර 2013.09.17 දිනය (අඟහරුවාදා දින) සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස සලකා ක්‍රියාකළ යුතුය ."

X. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට

යෝජනාව :

" අද දින (2013.09.03) න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ ඇති කාර්යයන්හි අනුපිළිවෙල පිළිවෙලින් අංක 06, 07, 01, 02, 03, 04 හා 05 වන පරිදි සංශෝධනය විය යුතුයැයි සළකා ක්‍රියා කළ යුතුය."

## XI. පොදු කටයුතු

01. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)

### ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා
### (කළුතර ප්‍රාදේශීය සභාව)

'1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද කළුතර ප්‍රාදේශීය සභාවේ - *"ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"* නම්වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 දරණ හා 2011.09.29 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,

එකී අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ 2013.06.18 දින, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, තවදුරටත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින්, තම නිර්දේශයන්ද, ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය.'

02. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)

## නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2වැනි වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද,

නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ 2013.06.18 දින අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින් තම නිර්දේශයන්ද ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය.

03. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)

### ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද,

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ 2013.06.18 දින අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින් සිය නිර්දේශයන්ද ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය.

03. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)

## ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද,

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ 2013.06.18 දින අනුමැතිය සඳහා මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින් සිය නිර්දේශයන්ද ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය.

04. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)

## ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

## (පානදුර නගර සභාව)

255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 157 (14 අ) වන උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 153 වන වගන්තිය යටතේ පානදුර නගර සභාව විසින් සාදන ලද පානදුර නගර සභාවේ - *"ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා"* නම්වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු වූ 255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 154 වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම් අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1783/39 දරණ 2012 නොවැම්බර් මස 09 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,

එකී අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කර සිටිමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 156 වන වගන්තිය යටතේ 2013.06.18 දින මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තවදුරටත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡා කර එම කාරක සභාව විසින් තම නිර්දේශයන්ද ලබා දී ඇති හෙයින් එම නිර්දේශයන් පිළිබඳවද සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුය.

05. ගරු මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදිකිරීම්, ධීවර හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.)

*'2013 අංක ................. දරණ බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය.'*

(දෙවනවර කියැවීම)

[ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියැවීම **2013.06.18** දින සිදුකර ඇත.]

06. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

<u>ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා</u>

(අත්තනගල්ල ප්‍රාදේශීය සභාව)

'1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126(xiv) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, අත්තනගල්ල ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද, "අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ, ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලි බල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1788/8 දරණ, 2012 දෙසැම්බර් මස 11 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන්නට යෙදුන අතර,

එකී අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට, යෝජනා කරමින් ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.'

[අදාල ලිපිලේඛන 2013.08.19 දිනැති සභා න්‍යාය පත්‍රය සමගම් සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සළස්වා ඇත]

07. ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

**කුලී ත්‍රී රෝද රථ නවතා තැබීම විධිමත් කිරීම, පාලනය කිරීම**

**සහ**

**<u>ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා</u>**

(කඩුවෙල මහා නගර සභාව)

"252 වන අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 267 වන වගන්තියේ (1) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥා පනතේ 272 වන වගන්තියේ 32 උප වගන්තිය යටතේ කඩුවෙල මහා නගර සභාව විසින් සාදන ලද කඩුවෙල මහානගර සභා බල ප්‍රදේශය තුල කුලී ත්‍රී රෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,

1989 අංක 12 දරණ පළාත් සභා ( ආනුෂංගික විධිවිධාන) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය සමග කියවිය යුතු වූ 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලි බල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර .

එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1788/8 දරණ 2012 දෙසැම්බර් මස 11 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන්නට යෙදුන අතර, එකී අතුරු ව්‍යවස්ථාවන් ස්ථිර කරන ලෙසට යෝජනා කර සිටිමින් ම එම අතුරු ව්‍යාවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 268 වන උප වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි.

(අදාල ලිපිලේඛන 2013.08.19 දිනැති සභා න්‍යාය පත්‍රය සමගම සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා ඇත)

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු සිරිකමල් පිලිෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා :

"ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යපනය ක්‍රියාත්මක වන රටක් බව ප්‍රකාශිතය එහෙත් රට තුල මධ්‍යම රජය, පළාත් සභා, පෞද්ගලික, ජාත්‍යන්තර, යනුවෙන් පාසැල් පද්ධතියක් ක්‍රියාත්මකව ඇති බව අපි දනිමු. මේ අතරින් බහුතර පාසැල් සංඛ්‍යාව අයත් වන්නේ පළාත් සභාවලටය. මෙම පළාත් සභාව වාර්ෂික අය වැය මගින් ප්‍රතිශතයක් ලෙස වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේ ප්‍රධාන අමාත්‍යවරයා නියෝජන කරන අධ්‍යාපන අමාත්‍යංශයටය. එහෙත් අප පළාතේ පාසැල් නඩත්තුව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව බලධාරීන් විසින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන්, දෙමව්පියන්, ආදිසිසුන්, සුභ පතන්නන් හා වෙනත් විවිධ ක්‍රම මගින් විදුහල් වල අඩුපාඩු සකස්කර ගන්නා බව නොරහසකි අවිධිමත් ලෙස සිදුවන මෙම ක්‍රියාවලිය නිසා දෙමාපියන්, සිසුන් පත් වන අපහසුතාවය මග හරවා ගැනීම සඳහා විධිමත් ක්‍රමෝපායක් කඩිනමින් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත සභාව අදහස් කරයි."
(යෝ/v(01)13/02)

02. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා :

"වර්තමානයේ පවතින පළාත් සභා හා පාර්ලිමේන්තු අනුපාත මැතිවරණ ක්‍රමය ඉදිරිපත් වන අපේක්ෂකයන්ට මෙන්ම ඡන්ද දායකයන්ටද ඉතා අපහසු ගැටළුකාරී මැතිවරණ ක්‍රමයක් වන බැවින්, ඉදිරියේදී පවත්වන සියළු මැතිවරණ නව පළාත් පාලන මැතිවරණ ක්‍රමය මෙන්, පළාත් සභා කොට්ඨාශ මට්ටමින්ද, පාර්ලිමේන්තු මැතිවරණය ආසන මට්ටමින්ද, පැවැත්වීමට කටයුතු කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයට යෝජනා කර සිටියි." (යෝ/v(01)13/04)

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.08.19 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.